**යටවත්ත ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ආදායම් හා වියදම් ගිණුම් විෂයයන් 09ක එකතුව රු.10,063,304ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ). ඔරලෝසු කණුව ඉදිකිරීම සඳහා පළාත් නැගුම ව්‍යාපෘතිය යටතේ වැය කර තිබුණු රු.1,279,176ක වියදම ප්‍රාග්ධනිත නොකිරීම නිසා වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය එම අගයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඇ). සභා ශාලාව ඉදිකිරීම සඳහා දරා තිබුණු රු.1,085,814ක වියදම හා වල්පොල සුසාන භූමිය ඉදිකිරීම සඳහා දරා තිබුණු රු.1,071,145ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ). පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබුණු රු.216,999ක් වූ ගැල්වනයිස් බට 196ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

මූලාා ප්‍රකාශනවල දැක්වෙන අත්තිකාරම් ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.1,000,000ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම රු.4,019,996ක් වූ අතර, ඊට වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.196,173ක ශේෂ ඇතුළත්වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 04ක වටිනාකම රු.18,133,612ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.57,960ක් වූ ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.619,345ක් ගිණුම් විෂයයන් 04කට අදාල වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

--------------------------------------------------------------

රාජා සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් ලද විධිමත් පත්වීම් ලිපියක් නොමැතිව සභාවේ කාර්මික නිලධාරී තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු විශ්‍රාමික නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.220,000ක දීමනා සහා අරමුදලින් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,111,150 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,494,207 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,383,057ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 02 ක කාල පරිච්ඡේදය තුළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ආ). මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට මෙම ප්‍රතිශතයේ අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 අක්කර බදු
--------------

රු.140,790 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වැරදි බිල් කිරීම් මත ගණනය කරන ලද රු.88,298 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

2.3.2 බලපත්‍ර ගාස්තු
-----------------

2004 වර්ෂයට පෙර සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එන හිඟ හිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.35,060 ක් විය.

2.3.3 වෙනත් ආදායම්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.110,055ක් වූ ජල ගාස්තු ශේෂයක් හා එකතුව රු.25,300 ක් වූ කසළ ගාස්තු ශේෂයක්ද හිඟව පැවතුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 843,785 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 1,356,070 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂවලදී පනවන ලද අධිභාරවලට අදාලව රු.32,259 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්ය සාධනය ඇගයීම.

--------------------------

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ආදාහනාගාරයක් ඉදිකිරීම, ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම, ක්‍රීඩා පිටියක් හා ක්‍රීඩාංගනයක් ඉදිකිරීම හා පෙරපාසැල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ප්‍රධාන අරමුණු වී තිබුණද, එකී ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොතිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 17 (i),(ii) සහ (iii) යන වගන්තිවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවී සභාවට අයත් වාලවෙල ගම්සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙහි දිවි නැගුම දෙපාර්තමේන්තුව මඟින් ගොඩනැගිලි ඉදිකර දිවි නැගුම ප්‍රජා මූල බැංකුව හා ප්‍රජා මූල බැංකු සමිති පවත්වාගෙන යන නමුත්, ප්‍රාදේශීය සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව, ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේදි ලැබී තිබුණු අයදුම්පත් 262 කින් අයදුම්පත් 179 ක් අනුමත කර තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 08ක් සඳහා පමණි.

(ආ). නිකුත් කරන ලද පරිසර බලපත්‍ර 07 ක් කල් ඉකුත් වී තිබුණු නමුත්, ඒ පිළිබඳ පසු විපරම් කර නොතිබුණු අතර, පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ආයතන 44ක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමටද පියවර ගෙන නොතිබුණි.

(ඇ) 1987 වර්ෂයෙන් පසුව සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් කර නොතිබුණි.

3.4 නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පිරිවැය රු.413,000ක් වූ ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් සහ රු.3,450,574 ක් වටිනා ටිපර් රථයක්ද වර්ෂයක කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට යොදවා ගෙන නොතිබුණු අතර, ධාවන තත්ත්වයේ පවතින රු.1,200,000 ක් වටිනා ඉසුසු ලොරි රථය වසර 02ක පමණ කාලයක සිට නිශ්චිත කාර්යයකට යොදා නොගෙන සභා භූමියේ ගාල් කර තිබුණි.

3.5 අවිධිමත් ගනුදෙනු

-----------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19( i) (i) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා රු.340,434ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන අනුව 159 (i) වගන්තිය අනුව ලේකම්වරයා විසින් බලය පවරා නොතිබුණු නමුත්, ආදායම් පරීක්ෂකවරයා විසින් සමාලෝචිත වර්ෂයේදී රු.458,756 ක ආදායම් එකතුකර තිබුණි

(ඇ) සභාවේ ලේකම්වරියගේ නමින් ගෘහස්ථ දුරකථනයක් නොතිබුණු නමුත්, දුරකථන දීමනා වෙනුවෙන් රු.10,620 ක් හා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු ජංගම දුරකථනයක් වෙනුවෙන් 2013 මැයි 27 දිනැති අංක 04/2013 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව රු.28,500 ක දීමනාවක් ගෙවා තිබුණි.

3.6 හඳුනාගත් අලාභ
--------------------

ඉකුත් වර්ෂ 07 සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන 05ක් වෙනුවෙන් වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා සභා අරමුදලින් රු.36,500ක දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------------

2012 වර්ෂය වන විට රු.659,062ක් වැය කර පළාත් නිශ්චිත ප්‍රදාන හා සභා අරමුදල් මත ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද, එය කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යොදා ගෙන නොතිබුණි. බල ප්‍රදේශයේ සුළු කොටසක පමණක් කසළ එකතු කිරීමත්, නොදිරන ද්‍රව්‍ය ආවරණයක් නොමැතිව පුළුස්සා දැමීමේ ක්‍රමයක් අනුගමනය කිරීමත් නිසා, පරිසරයට හානිකර තත්ත්වයක් උද්ගතවී තිබුණු අතර, ප්‍රාදේශීය සභාව නිසි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියකට යොමු වී නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-------------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
--------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු
---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/ සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 06ක් සඳහා ඇස්තමේන්තුගත රු.2,568,000ක ආදායම් උපයා ගැනීමට සභාව අසමත් වී තිබු අතර,තවත් ආදායම් විෂයයන් 14 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර සියයට 15 සිට සියයට 89 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 29 ක් සඳහා සලසාදී තිබූ රු.4,835,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 25ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 1 සිට සියයට 67 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

5. පද්ධති හා පාලන
---------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ). වත්කම් කළමණාකරණය
(ඈ). ණයගැති සහ ණයහිමි පාලනය
(ඉ). කොන්ත්‍රාත් පාලනය
(ඊ). මානව සම්පත් කළමණාකරණය